Department of Education,Sabaragamuwa Province/ Weekly School

# පළාත් අධ්‍යාපන දෙපාතර්මේන්තුව සබරගමුව - සති පාසල

විෂය - තොරතුරු හා සන්නිවේදන තාක්ෂණය

සතිය- පළමු සතිය

ශ්‍රේණිය - 9 ශ්‍රේණිය

Prepared by- ජානක පුෂ්පකුමාර- කහවත්ත ම.ම.වි.

- *මේ කාලය තුළ සෑම විෂයක්ම පුණරීක්ෂණයේ යෙදෙමින් අධ්‍යාපන කටයුතු වළ නිරතවීම ඔබගේ වගකීමකි.*
- *පළමු පාඩම මේ වන විට ඔබට උගන්වා අවසන් වී ඇති අතර පළමු පාඩමට අදාල කියවීම් පොත, වැඩපොත හා ඔබගේ අභ්‍යාස පොත අධ්‍යයනය කර පහත ක්‍රියාකාරකම් වල නිරතවන්න.*
- *මෙම කායර්ය සඳහා ඔබට සතියක කාලයක් ලැබේ.*
- *ඔබේ පිළිතුරු හෝ නිමර්ාණ **<u>පළමු සතිය-ICT- ඔබේ නම හා ශ්‍රේණිය</u>** ලියන ලද අමුණන ලද ගොනුවක් සේ සකස්කරන්න.*

01) පරිගණකයක කොටස් දැක්වෙන දළ රූප සටහනක් A4 ප්‍රමාණයේ පෝස්ටරයක් ලෙස සකසන්න.
(කියවීම් පොතේ පිටු අංක 5 බලන්න)

02) "පරිගණකයේ වැදගත්ම ඒකකය එහි සකසනයයි" මෙම ප්‍රකාශය සනාථ කරමින් වාක්‍ය රචනයක් ලියන්න. (වචන 100 ක පමණ)

03) පරිගණකයක් මිලදී ගන්නට බලාපොරොත්තු වන ඔබේ යහළුවෙකු එය මිලදීගැනීමට පෙර සොයා බැලිය යුතු ප්‍රධාන කරුණු මොනවාදැයි ඔබෙන් විමසන ලද්දේනම් ඔබ දෙන පිළිතුර කුමක්ද?

04) ඔබ පරිගණක අලෙවි කරුවෙකුයැයි සළකා, පරිගණකයක් අලෙවි කිරීම සඳහා සුදුසු වෙළඳ දැන්වීමක් සකස් කරන්න.

05) ඔබ නිවසට ගෙන එන ලද කිසියම් භාණ්ඩයකට ( CFL bulb, TV, Computer) ලැබුණු වගකීම් සහතිකයක් වැඩිහිටියෙක්ගෙන් ඉල්ලාගෙන එය නිරීක්ෂණය කර එහි සඳහන් කරුණු අතරින් වැදගත් යැයි ඔබට හිතෙන කරුණු කිහිපයක් සටහන් කරන්න. (ඔබට එවැන්නක් සොයාගත නොහැති වුවහොත් වැඩිහිටියෙකුගෙන් අසා කරුණු ලියන්න)